# මුල් ළමාවිය සංවර්ධන සහය උපදේශිකා (සහය ගුරු)/ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකා තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.

කුණ්ඩසාලේ, නව නගරයේ, අංක 2A ලිපිනයේ පිහිටි මධ්‍යම පළාත් මුල් ළමා විය සංවර්ධන ඒකක කාර්යාල පරිශ්‍රයේ 2024 වර්ෂයේ සිට ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ආදර්ශ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයට උක්ත තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත මූලික සුදුසුකම් සහිත අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- ✓ අයදුම්කරු ශ්‍රී ලාංකිය පුරවැසියෙක් විය යුතුය.
- ✓ අයදුම්පත් භාරගත්තා අවසන් දිනට පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩව මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිය සහිත විය යුතුය.
- ✓ අයදුම්පත් භාර ගත්තා අවසන් දිනට වයස අවු 18 ට නොඅඩු හා 40 ට නොවැඩි විය යුතුය.
- ✓ අ. පො. ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සම්මාන තුනක් සහිතව පළමු බස සහ ගණිතය සහිතව අවම වශයෙන් විෂයන් 06 ක් සමත්ව තිබිය යුතුය.
- ✓ පිළිගත් ආයතනයකින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාව හෝ දෑ අවුරුදු උසස් සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබිය යුතුය.
- ✓ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකාවක වශයෙන් වසරකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.
- ✓ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක උපදේශිකාවක (පෙර පාසැල් ගුරුවරියක) වශයෙන් සේවය කර ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

මේ සඳහා අයදුම්කරන්නන් අයදුම්පත හා සෙසු තොරතුරු **www.cm.cp.gov.lk** වෙබ් අඩවියෙන් භාගත කර ගැනීමෙන් හෝ අංක 2A, නව නගරය, කුණ්ඩසාලේ ලිපිනයේ පිහිටි පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකයට පැමිණ ලබා ගත හැකි අතර, අයදුම්පත් භාරගත්තා අවසාන දිනය **2025.01.15** වේ.

**අධ්‍යක්ෂ,**
**පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය,**
**අංක 2A නව නගරය, කුණ්ඩසාලේ.**
**දු.අ. 0812424337**